SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
07	පෙරදිග සංගීතය	I,II	පැය 1 1/2

නම :- ..... විභාග අංකය :- .....

I කොටස

සැලකිය යුතුයි:

*** ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ **දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) සප්තකයේ ඇති අචල ස්වර වනුයේ,

(1) ම , ප (2) ස , ප (3) රි , ස (4) ග , ප

(02) ෂඩ්ජයේ සිට මධ්‍යමය අතර ඇති ශුද්ධ ස්වර මොනවා ද?

(1) ස , රි (2) රි , ග (3) රි , ග (4) ග , ම

(03) ස්වර පුවරු සංගීත භාණ්ඩයක ස රි ග රි යන ස්වර හතර සඳහා ඇඟිලි හැසිරවිය යුත්තේ,

(1) 1 2 3 4 ලෙසිනි (2) 1 2 3 2 ලෙසිනි (3) 1 2 1 3 ලෙසිනි (4) 1 2 1 2 ලෙසිනි

(04)

		ස		
	ස	රි	ස	
ස	රි	ග	රි	ස

මීළඟට යෙදෙන ස්වර ඛන්ඩය වනුයේ,

(1) ස රි ග ම ග රි ස (2) රි ග ම ප ස රි ස

(3) ග ම ග ම ග රි ස (4) ස රි ස ග ම රි ස

(05) "කඳුපෙළ අතරේ තුරු වදුලේ" ස්වර ස්ථාපන ගී පාදය නිවැරදි ලෙස ප්‍රස්තාරකර ඇති පේළිය වනුයේ,

(1)
ක ඳු පෙ	ළ අ ත රේ s	තු රු ව	දු ලේ s s
ස ස ග	ග රි රි ග -	ස ස රි	රි ග - -

(2)
ස ස ග	රි රි ග -	ස ස රි රි	ග - - -
ක ඳු පෙ	ළ අ ත රේ	තු රු ව දු	ලේ s s s

(3)
ස ස ග ග	රි රි ග -	ස ස රි රි	ග - - -
ක ඳු පෙ ළ	අ ත රේ s	තු රු ව දු	ලේ s s s

(4)
ක ඳු පෙ ළ	අ ත රේ s	තු රු ව දු	ලේ s s s
ස ස ග ග	රි රි ග -	ග ග රි රි	ස - - -

(06) මාත්‍රා 3න් 3ට බෙදෙන ගී පාදය වනුයේ,

(1) බැතිනා සිරිපා කරුණා කරනා ගී පාදයයි.

(2) කඳුපෙළ අතරේ තුරුවදුලේ ගී පාදයයි.

(3) සවන පිනන ගීත මිහිර ගී පාදයයි.

(4) කඳු කඳු නැගෙනා ගී පාදයයි.

For Educational Purpose Only

SLGURU.LK

(07) හාර්මෝනියම් නැමති සංගීත භාණ්ඩයේ කෝමල රිෂභය පිහිටා ඇත්තේ,

(1) "ස" ස්වරය හා "රි" ස්වරය අතර ය. (2) "ම" ස්වරය හා "ප" ස්වරය අතර ය.

(3) "රි" ස්වරය හා "ග" ස්වරය අතර ය. (4) "ප" ස්වරය හා "ග" ස්වරය අතර ය.

❖ **හිස්තැනට සුදුසු නිවැරදි වචන යොදා පහත වගුව පුරවන්න.**

	නිර්මාපකයා	නාට්‍යය	ගීතය
(8)	ජෝන් ද සිල්වා මහතා	.....	අඹ දඹ නාරං
(9)	.....	විදුර	දම්වැසි වස්සන ලෝකේ
(10)	ජෝන් ද සිල්වා මහතා	.....	දන්න වංහුං

❖ **පහත දැක්වෙන වගුවේ A තීරුවේ ඇති කරුණුවලට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

	A	B
(11)	කටින් පිඹීමෙන් නාදය නිපදවන ස්වර වාදනය සඳහා සිදුරු 6කින් යුක්ත භාණ්ඩයකි.	විදුලි ඕගනය
(12)	අපරදිග තූර්ය වාදන කණ්ඩායම්වල ස්වර වාදනය සඳහා යොදාගන්නා භාණ්ඩයකි.	මවුත්ඕගන්
(13)	ඉහළට හා පහළට පිඹීමෙන් හඬ නිපදවන භාණ්ඩයකි.	හාර්මෝනියම්
(14)	බැලෝ එකක් මගින් ඇතුළට ගන්නා වාතය නළාව හරහා පිටවීමෙන් හඬ නිපදවන භාණ්ඩයකි.	මෙලෝඩිකාව
(15)	භාණ්ඩ රැසක නාද හා තාල රටා ඇතුළත් භාණ්ඩයකි.	බටනලාව

(16) කකුලක් නොන්ඩි ගසන, මහළු චරිතයකි. අතේ හැරමිටියක් හා කරේ ඔලගුවක් දමා ඇත. මෙම චරිතය කෝලම් සම්ප්‍රදායේ එක් චරිතයක ලක්ෂණයන් ය.

(1) හේවායා (2) රජු (3) ජසයා (4) ලෙන්චිනා

(17) "මං වගේ පේඩිකතක් මනා" මෙම ගීතය ගයනු ලබන්නේ,

(1) අණ බෙර කරුය. (2) ලෙන්චිනා ය

(3) ජසයා ය. (4) සබේ විදානේ ය.

(18) උඩුනියරෙන් වැටී ගෙනේ... මෙම කවියේ දෙවන පාදය වනුයේ,

(1) තලවිටි බොල් පොලාගෙනේ (2) එයි අම්මා විගසකිනේ

(3) මිටි නියරෙන් වැටී ගෙනේ (4) අතට වෙරළු ඇහිඳ ගෙනේ

(19) බංකු රබාන වාදනය කරනු ලබන්නේ,

(1) අවුරුදු උත්සවයේ දී ය. (2) ආගමික උත්සවවලදී ය.

(3) තෙපොංගල් උත්සවයේදී ය. (4) නත්තල් උත්සවයේ දී ය.

(20) උපදේශාත්මක ගීත ශ්‍රවණය කිරීමෙන්,

(1) දක්ෂ නිර්මාණකරුවෙකු බිහිවේ. (2) දක්ෂ ගීත රචකයෙකු බිහිවේ.

(3) යහපත් පුරවැසියෙකු බිහිවේ. (4) දක්ෂ ගී තනු නිර්මාපකයකු බිහිවේ.

(ලකුණු 1 x 20 = 20)

For Educational Purpose Only

SLGURU.LK

II කොටස

සැ.යු. පහත සඳහන් ප්‍රශ්න අතරින් ඔබ කැමැති ප්‍රශ්න 03ක් තෝරා පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 10බැගින් හිමිවේ.

(01) (i) ඔබ උගත් ස්වර ස්ථාපන ගීයක ගීත ස්වර ප්‍රස්ථාර කර දක්වන්න. (ලකුණු 05)

(ii) එම ගීතය වැයීමට සුදුසු තාලය නම් කරන්න. (ලකුණු 02)

(iii) එම තාලය නියමිත පරිදි ප්‍රස්ථාර කරන්න. (ලකුණු 03)

(02) (i) ඔබ වඩාත් කැමැත්තෙන් තෝරා ගන්නා ලද භාණ්ඩයේ රූපසටහනක් ඇඳ ස්වර සප්තකය පිහිටා ඇති ආකාරය ලකුණු කරන්න. (ලකුණු 08)

(ii) එම භාණ්ඩයේ නම සඳහන් කරන්න. (ලකුණු 02)

(03) (i) "අහස" සහ "වැස්ස" යන මාතෘකා දෙකින් ඔබ කැමැති එක් මාතෘකාවක් තෝරාගෙන ගී පදමාලාවක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

(ii) ජනමාධ්‍ය මගින් ඔබට අසන්නට ලැබෙන ළමා ගීත දෙකක මුල් පේළිය ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (i) පහත සඳහන් ගීතයේ හිස්තැන් සඳහා නියමිත පද මාලාව ලියා සම්පූර්ණ කරන්න.

සඳුන් කොකුම් මොර සුගාන

.....

.....

ළඳුන් දුටද රජගෙට යන (ලකුණු 04)

(ii) "හෙලේ වලේ ලෝවෙලමා - ලේලකඩි ලේලෝ"

මෙම ගී වර්ගය කිනම් ජන ගීත ශෛලියකට අයත්වේ ද? (ලකුණු 02)

(iii) දරු නැළවිලි ගීත හා රබන් ගී පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.

(එක් වර්ගයකින් කරුණු 02ක් සෑහේ) (ලකුණු 02) (ලකුණු 04)

For Educational Purpose Only

“Success is not final, failure is not fatal: it is the courage to continue that counts.” — Winston Churchill



Visit SLGURU.LK to download papers and notes.